**රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක:01/03**

මගේ අංකය: ඊ/1/92/1/2003,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 46, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.
2003 සැප්තැම්බර් මස 12 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන් පිළිබඳ බලතල පැවරීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඇතැම් නිශ්චිත බලතල අවස්ථාවෝචිත පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරනු ලැබ ඇති 2003 ජූලි මස 02 දාතමින් යුත් අංක:1295/26 දරණ ගැසට් නිවේදනයට ඔබේ අවධානය යොමු කරනු ලැබේ. එහි සඳහන් නොවූ අනෙකුත් සියලුම බලතල තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතම පවතිනු ඇත.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල සම්බන්ධ පරිපාලන කාර්යයන් කොමිෂන් සභාවේ නියෝග සහ ඒ මගින් සපයනු ලබන මග පෙන්වීම් වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා පහතින් දක්වා ඇති බලධාරීන් වෙත මෙයින් පවරනු ලැබේ.

| I. බලතල පැවරීමට යටත්වන සේවාවන් / නිලධාරීන් | පරිපාලන බලතල පවරනු ලබන බලධාරීන් |
|---|---|
| - ශ්‍රී ලංකා පරිපාලන සේවය | -රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | -රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය | -රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | -රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා ගණකාධිකාර සේවය | - භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් |
| - ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවය | - ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | - අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | - කෘෂිකර්ම විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | - සත්ව නිෂ්පාදන විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - වෛද්‍ය සේවය | - සෞඛ්‍ය සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම් |
| - දේශීය වෛද්‍ය සේවය | - දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශ ලේකම් |

II. දීප ව්‍යාප්ත සේවා කවරකට හෝ අයත් නොවන මාණ්ඩලික ශ්‍රේණි නිලධාරීන්. - අදාල විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරුන්

III. අමාත්‍යාංශයක් යටතේ නොවන දෙපාර්තමේන්තු සහ ආයතනවල මාණ්ඩලික ශ්‍රේණි නිලධාරීන් - අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ආයතන ප්‍රධානියා.

03. අමාත්‍යාංශ ලේකම්වරුන් හා අමාත්‍යාංශයක් යටතට නොගැනෙන දෙපාර්තමේන්තුවල හා ආයතනවල ප්‍රධානීන් විසින් ස්වකීය [illegible] ගැනෙන සේවා ව්‍යවස්ථා යෝග්‍ය පරිදි සංශෝධනය කිරීමට පියවර ගත යුතුය.

04. ශ්‍රී ලංකා ගණකාධිකාර සේවා සම්බන්ධයෙන් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් අමාත්‍යාංශ ලේකම්වරුන් යටතට ඇතුළත් විය යුතුය.

05. රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නව රීති සහ රෙගුලාසි සම්පාදනය කරනු ලබන තෙක් පත්කිරීම්, උසස්කිරීම් සහ විනය පාලනය පිළිබඳව පවත්නා ක්‍රියාමාර්ගයන්ම වලංගුව පැවතිය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණපරිදි,

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.